# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1984/6 - 2016 සැප්තැම්බර් මස 13 වැනි අඟහරුවාදා - 2016.09.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ පළාත් සභාව

වයඹ පළාතේ පළාත් සභාවේ 2016 අංක.......... දරන පශු සම්පත් ප්‍රඥප්තිය

වයඹ පළාත තුළ තිරසාර සංවර්ධනයක් උදෙසා වූ පළාත් පශු සම්පත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ අරමුණු ළඟා කර ගැනීම සඳහාත් පශු සම්පත් සංරක්ෂණය, රැකගැනීම, වැඩිදියුණු කිරීම සහ සත්ත්ව රෝග වැළැක්වීම සම්බන්ධයෙන් සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම සඳහා ප්‍රතිපාදන සැලසීම සඳහාත් ඊට ආනුශංගික වන කරුණු පිළිබඳව විධිවිධාන සැලැස්වීම සඳහාත් 1998 අංක 04 දරන වයඹ පළාත් සත්ත්ව පාලන ප්‍රඥප්තිය පරිච්ජින්න කිරීම සඳහාත් වූ ප්‍රඥප්තියකි. දීර්ඝ නාමය.

මෙම ප්‍රඥප්තිය 1968 අංක 10 සහ 1988 අංක 46 2009 අංක 10 දරන සංශෝධිත පනත් වලින් සංශෝධිත 1958 අංක 29 දරන සත්ත්ව පනත, 1986 අංක 15 දරන සත්ත්ව ආහාර පනත හා 1893 අංක 9 දරන ගෝ ඝාතක ආඥා පනත, 1992 අංක 59 දරන සත්ත්ව රෝග පනත, 1952 අංක 33 දරන වසංගත රෝග පනත, 1956 අංක 23 දරන ජලභීතිකා මර්දන පනත 1998 අංක 16 දරන පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික පනත, 1968 ගවඝාතක පනත, 2004 මස් පරීක්ෂාව පනත යන පනත් වලට අදාල වන පරිදි අනනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 2016 අංක ............ දරන පශු සම්පත් ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

02. වයඹ පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලත් දින සිට මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන්නේය. ක්‍රියාත්මක වන දිනය.

03. ප්‍රඥප්තියේ අරමුණු ප්‍රඥප්තියේ අරමුණු.

(1) ජාතික ප්‍රතිපත්තියට සහ පළාතේ අවශ්‍යතාවලට අනුකූලව පශු සම්පත් ආශ්‍රිත ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම හා නියාමනයට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම
(2) වයඹ පළාත තුල පශු සම්පත් සංරක්ෂණය, නියාමනය, රැකබලා ගැනීම, වැඩි දියුණු කිරීම, සත්ත්ව ආහාර සහ ඖෂධ නිෂ්පාදනය හා පරිහරණය, සත්ත්ව රෝග වැළැක්වීම සඳහා නෛතික ප්‍රතිපාදන සැලැස්වීම.
(3) වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පිහිටුවීම.
(4) වයඹ පශු සම්පත් සංවර්ධන පළාත් කමිටුව පිහිටුවීම.
(5) වයඹ පළාතේ පශු සම්පත් ක්ෂේත්‍රයේ නියුතු ගොවීන් සවිබල ගැන්වීම.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(6) වයඹ පළාතේ පශු සම්පත් ක්ෂේත්‍රයේ නියුතු වූවන්ගේ කලාප, ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන කමිටු හා ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති පිහිටුවීම.

(7) නිසි ප්‍රමිතියෙන් යුතු පරිසර හිතකාමී ගොවිපල පවත්වාගෙන යාම හා සෞඛ්‍යාරක්ෂිත, ගුණාත්මක සත්ත්ව නිෂ්පාදනයන් පළාත තුල තහවුරු කිරීම.

(8) වයඹ පළාත් ක්ෂීර ප්‍රවර්ධන අරමුදල පිහිටුවීම හා කළමනාකරණය.

## 1 වන කොටස

### *ප්‍රතිපත්ති සම්පාදනය, කළමනාකරණය හා නියාමනය*

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය.

04. ජාතික ප්‍රතිපත්තියට හා පළාතේ අවශ්‍යතාවයට අනුව වයඹ පළාත තුල සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන ක්ෂේත්‍රයට අදාල ප්‍රතිපත්ති සම්පාදනය කිරීම විෂයයභාර පළාත් අමාත්‍යාංශය වෙත පැවරෙන්නේය. ඒ සඳහා පළාත තුල ස්ථාපිත ග්‍රාමීය, ප්‍රාදේශීය, කලාප හා පලාත් පශු සම්පත් සංවර්ධන කමිටුවල හා රාජ්‍ය, අර්ධ රාජ්‍ය, සමුපකාර, රාජ්‍ය නොවන ආයතන, ස්වේච්ඡා සංවිධාන හා පුද්ගලයින්ගේ යෝජනා ලබා ගත හැකි වන්නේය.

පළාත් පශු සම්පත් සංවර්ධන සැලැස්ම .

05. ඉහත 04 වගන්තියේ යෝජනාද සැලකිල්ලට ගෙන වසර පහක් සඳහා වන පළාත් පශු සම්පත් සංවර්ධන සැලැස්ම වසර 05කට වරක් පළාත් අධ්‍යක්ෂවරයා විසින් සකස් කර පළාත් පශු සම්පත් සංවර්ධන කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වන්නේය.

සේවාවන් සැපයීම.

06. පළාතේ පශු සම්පත් ක්ෂේත්‍රයේ නියුතු වූවන්ට අවශ්‍ය වන පශු සම්පත්, සෞඛ්‍ය, අභිජනන, ව්‍යාප්ති, පුහුණු, අලෙවිකරණ, ප්‍රවර්ධන සහ පළාත්බද පර්යේෂණ ඇතුළු සේවාවන් විෂයභාර පළාත් අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තුව විසින් සැපයිය යුතු වන්නේය.

සත්ත්ව සංවර්ධන උපදේශක කොට්ඨාශ, ප්‍රාදේශීය පශු වෛද්‍ය කොට්ඨාශ, කලාප නිර්ණය කිරීම.

07. ජාතික ප්‍රතිපත්තිය හා පළාත තුල ජනගහණ ව්‍යාප්තිය, භූමි ප්‍රමාණය, සත්ත්ව ගහණය, දේශගුණික තත්ත්වයන් හා පරිපාලන සීමාවන් පදනම් කරගෙන සත්ත්ව සංවර්ධන උපදේශක කොට්ඨාස, ප්‍රාදේශීය පශු වෛද්‍ය නිලධාරි කොට්ඨාස හා කලාප නිර්ණය කළ යුතු වන්නේය.

පර්යේෂණ ආයතන පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම.

08. පළාතේ අවශ්‍යතාවයන් සඳහා පර්යේෂණ කටයුතු පිළිබඳ ආයතන පිහිටුවීම සහ පවත්වාගෙන යාම කළහැකි වන්නේය.

මානව සම්පත් සංවර්ධන ඒකක පිහිටුවීම.

09. පශු සම්පත් සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා පාර්ශවකරුවන් සවිබල ගැන්වීමේ කාර්යය උදෙසා මානව සම්පත් සංවර්ධන අංශ හෝ ඒකක පිහිටුවිය හැක්කේය.

## II වන කොටස

### *පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පිහිටුවීම, සංයුතිය, බලතල, හා කාර්යභාරය*

දෙපාර්තමේන්තුව පිහිටුවීම.

10. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා අරමුණු ලඟාකර ගැනීම සඳහා වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යනුවෙන් දෙපාර්තමේන්තුවක් පිහිටුවිය යුත්තේය.

දෙපාර්තමේන්තුව නීතිගත ආයතනයක් බව.

11. වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති ස්වකීය නාමයෙන් පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල සියලු කටයුතු ඉටු කිරීමටද නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට ද වෙනත් නීති කෘත්‍යයන් සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමටද බලය ඇති සංස්ථාපිත ආයතනයක් වන්නේය.

පළාත් අධ්‍යක්ෂවරයා පත් කිරීම.

12. දෙපාර්තමේන්තුව වෙත පැවරෙන බලතල ක්‍රියාත්මක කිරීම සඳහා වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා යනුවෙන් හඳුන්වනු ලබන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පළමු පන්තියේ පශු වෛද්‍ය නිලධාරියකු, පළාත් අමාත්‍ය වරයාගේ එකඟතාවය මත වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා විසින් පත් කළ යුතු වන්නේය.

*දෙපාර්තමේන්තුවේ සංයුතිය.*

13. දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා අතිරේක පළාත් අධ්‍යක්ෂවරුන්, විෂයානුබද්ධ විශේෂඥවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, පශු වෛද්‍ය නිලධාරින්, සත්ත්ව පාලන නිලධාරීන්, සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් සහ අනෙකුත් සහය කාර්යය මණ්ඩල පත් කල හැකි වන්නේය.

*කාර්යය මණ්ඩලය පත් කිරීම.*

14. ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට වයඹ පළාතේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු සියළුම නිලධාරීන් සහ සේවකයින් මෙම ප්‍රඥප්තිය යටතේ පත් කරනු ලැබුවා සේ සැලකිය යුතු වන්නේය.

*පළාත් අධ්‍යක්ෂවරයා සතු බලතල හා වගකීම.*

15. (1) මෙම ප්‍රඥප්තියෙහි විධිවිධාන සහ ඊට ආනුෂංගික කාරණා සඳහා පනවනු ලබන නියෝග හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ බලතල ලේකම්වරයාගේ සාමාන්‍ය පරිපාලනයට යටත්ව අධ්‍යක්ෂවරයා වෙත පැවරෙන්නේය.

(2) අධ්‍යක්ෂවරයා විසින් අවස්ථාවෝචිත පරිදි ස්වකීය බලතල දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරීන් හට පවරා ක්‍රියාත්මක කළහැකි වන්නේය.

(3) දෙපාර්තමේන්තුව සතුව පවතින චංචල හා නිශ්චල දේපළ ඇතුලු සියලු භෞතික, මූල්‍ය හා මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා ලේකම්වරයාට වගකිවයුතු වන්නේය.

*ගොවිපල හෝ නිෂ්පාදනාගාර පරීක්ෂා කිරීමේ බලය.*

16. (1) මෙම ප්‍රඥප්තිය යටතේ වන විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ඕනෑම අවස්ථාවක ගොවිපලකට හෝ නිෂ්පාදනාගාරයකට හෝ අලෙවිසැලකට හෝ ශීතකරන මධ්‍යස්ථානයකට ඇතුළු වී පරීක්ෂා කිරීමේ බලය පළාත් අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියෙකුට ඇත්තේය.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ හෝ තම බලතල ක්‍රියාත්මක කිරීමෙහි යෙදී සිටින බලය ලත් නිලධාරියෙකුට බාධා කිරීම කිසිම තැනැත්තෙකු විසින් නොකල යුත්තේය.

(3) ඉහත 16 (1) වගන්තිය යටතේ පරීක්ෂාවක් කරන නිලධාරියෙකු වෙත ස්වකීය කාර්යභාරය යටතේ අවශ්‍ය වන්නා වූ නියැදි හෝ තොරතුරු සැපයීමට එසේ පරීක්ෂාවට ලක් වූ අයිතිකරු හෝ ඒ ස්ථානය භාරව සිටින තැනැත්තෙකු හෝ එහි සිට හමුවන සෑම තැනැත්තෙකුම බැඳී සිටිය යුත්තේය.

(4) සම්මත ක්‍රමයට නියැදි හෝ තොරතුරු ලබා ගැනීමේ නිරතව සිටින නිලධාරියෙකුට කිසිදු අයුරකින් අසත්‍ය හෝ නොමඟ යවන නියැදි හෝ තොරතුරු නොසැපයිය යුත්තේය.

*දෙපාර්තමේන්තුවේ කාර්යයභාරය හා වගකීම.*

17. පළාත තුල පශු සම්පත් සංවර්ධනය, සංරක්ෂණය, ප්‍රවර්ධනය, ව්‍යාප්තිය සහ නියාමනය සඳහා දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් කාර්යයන් ඉටුකල යුතු වන්නේය.

(1) පස් අවුරුදු සැලැස්මට අනුකූලව වාර්ෂික සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කිරීම.

(2) සත්ත්ව රෝග පාලනය, වැලැක්වීම හා ප්‍රතිකාර කටයුතු මගින් සතුන්ගේ සෞඛ්‍යාරක්ෂාව තහවුරු කිරීම.

(3) පළාතේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි පරිසරයට ගැලපෙන, ආරය උසස් සත්ව ගහණයක් පවත්වාගෙන යාම සඳහා අභිජනන කටයුතු ක්‍රියාත්මක කිරීම.

(4) ව්‍යාප්ති හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(5) නිෂ්පාදන හා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(6) පළාත් බද පර්යේෂණ හා සමීක්ෂණ පැවැත්වීම හා ප්‍රතිඵල සමාජගත කිරීම.

(7) පළාතට යෝග්‍ය නව තාක්ෂණය හා ගොවිපළ යාන්ත්‍රීකරණය හඳුන්වා දීම.

(8) ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටමේ පර්යේෂණ ආයතන, විශ්ව විද්‍යාල හා සත්ත්ව පාලනයට සම්බන්ධ වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

(9) සත්ත්ව ගොවිපළ සංවර්ධනයට අවශ්‍ය උසස් තත්ත්වයේ අභිජනන හා රෝපණ ද්‍රව්‍ය හඳුන්වාදීම සහ අලෙවිය.

(10) ග්‍රාමීය, ප්‍රාදේශීය, කලාප පශු සම්පත් සංවර්ධන කමිටු, සත්ත්ව ගොවිපල, සතුන් රැකගන්නන්, බෙදා හරින්නන්, ජංගම අලෙවිකරුවන්, පශු ඖෂධ, උපකරණ හා ආහාර නිෂ්පාදකයන්, බෙදා හරින්නන් හා පශු සම්පත් ක්ෂේත්‍රයට සම්බන්ධ සියලු ස්වේච්ඡා සංවිධාන සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීම, බලපත්‍ර නිකුත් කිරීම, අධීක්ෂණය කිරීම හා නියාමනය කිරීම.

(11) පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල සියලුම දත්ත පද්ධති යාවත්කාලීනව පවත්වාගෙන යාම,

(12) සත්ත්ව නිෂ්පාදනවල සෞඛ්‍ය ආරක්ෂිත බව හා ගුණාත්මක බව තහවුරු කිරීම සහ ගොවිපල ප්‍රමිතිකරණය,

(13) පළාත් අවශ්‍යතාවයන්ට අනුව රසායනාගාර පවත්වාගෙන යාම,

(14) පළාත තුළ සත්ත්ව රෝග වැලැක්වීම හා පාලනය කිරීම,

(15) සත්ත්ව ගොවිපළ, නිෂ්පාදනාගාර, ශීතාගාර, අලෙවිසල් සම්මත ප්‍රමිතීන්ට අනුව පරිසර හිතකාමී ලෙස පවත්වාගෙන යාමට විධිවිධාන සැලස්වීම හා නියාමනය කිරීම,

(16) සතුන්ගෙන් මිනිසාට බෝවන රෝග පාලනය හා වැළැක්වීම,

(17) සත්ත්ව සුබසාධනය තහවුරු කිරීම,

(18) වයඹ පළාත තුළ සතුන් ප්‍රවාහනයට අවසර ලබාදීම,

(19) පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ පළාත්බද ප්‍රදර්ශන, උත්සව හා තරග සංවිධානය හා ක්ෂේත්‍රයේ නියුතු වූවන් ඇගයීම,

(20) ග්‍රාමීය, ප්‍රාදේශීය, කලාප පශු සම්පත් සංවර්ධන කමිටුවල ගිණුම් පරීක්ෂා කිරීම හා අවශ්‍ය උපදෙස් ලබාදීම,

(21) සත්ත්ව ආහාර, සත්ත්ව අභිජනන ද්‍රව්‍ය, පශු ඖෂධ හා රසායන වර්ග, උපකරණ නිෂ්පාදනය, අලෙවිය හා පරිහරණය සම්බන්ධ කටයුතු නියාමනය කිරීම.

වාර්ෂික සැලැස්ම හා කාර්ය සාධන වාර්තාව

18. (1) මෙම ප්‍රඥප්තියේ 05 වැනි වගන්තියේ විධිවිධානවලට අනුව සකස් කරනු ලබන පළාත් පශු සම්පත් සංවර්ධන සැලැස්ම පදනම් කර ගනිමින් පළාත තුළ ඇති පශු සම්පත් ආයතන සංවර්ධනය හා සත්ත්ව පාලන කටයුතුවල ප්‍රවර්ධනය සඳහා වූ ඉදිරි වසරේ වාර්ෂික සංවර්ධන සැලැස්ම ඔක්තෝබර් මස 31 වැනි දිනට පෙර සකස් කර අධ්‍යක්ෂවරයා විසින් ලේකම්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළයුතු වන්නේය.

(2) වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරි වසරේ මාර්තු 15 වැනි දිනට පෙර අධ්‍යක්ෂවරයා විසින් සකස් කර ලේකම්වරයා වෙත ඉදිරිපත් කළයුතු වන්නේය.

## **III** වන කොටස

### *ආයතන සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීම*

ආයතන හා පුද්ගලයින් ලියාපදිංචි කිරීම.

19. වයඹ පළාත තුළ පශු සම්පත් ක්ෂේත්‍රයට සම්බන්ධ ගොවිපළ, නිෂ්පාදනාගාර, අලෙවිසල්, ශීතාගාර, ග්‍රාමීය, ප්‍රාදේශීය, කලාප පශු සම්පත් සංවර්ධන කමිටු, සතුන් රැකගන්නන්, බෙදා හරින්නන්, ජංගම අලෙවිකරුවන්, පශු ඖෂධ, උපකරණ හා ආහාර නිෂ්පාදකයන්, බෙදා හරින්නන් වයඹ පළාත තුළ නිෂ්පාදිත පශු සම්පත් මිලදී ගන්නා ආයතන, සියලු ස්වේච්ඡා සංවිධාන සහ පුද්ගලයින් සඳහා අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරනු ලබන ලියාපදිංචි සහතිකයක් ලබාගත යුතු අතර එය වසරකට වරක් අලුත් කළ යුතු ය.

ලියාපදිංචිය සඳහා අවශ්‍යතා

20. ලියාපදිංචිය සඳහා පහත සඳහන් අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ යුත්තේය.

(1) පළාත් අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන ආකෘති පත්‍රයකින් අයදුම් කල යුතු ය,

(2) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන ලියාපදිංචි ගාස්තුවක් ගෙවිය යුතු ය,

(3) මෙම ප්‍රඥප්තියේ 84 (1) වගන්තියේ නියෝගවලින් නියම කර ඇති නිර්නායක හා ප්‍රමිතීන්ට අනුකුල විය යුතු ය,

(4) සම්පූර්ණ කළ යුතු අනෙකුත් නීතිමය අවශ්‍යතා සපුරා තිබිය යුතු ය.

ලියාපදිංචි සහතිකය අන්සතු කිරීම

21. ලියාපදිංචි සහතිකයක ඇතුළත් තොරතුරු පළාත් අධ්‍යක්ෂවරයාගේ අනුමැතියකින් තොරව වෙනස් කිරීම, පැවරීම හෝ අන්සතු කිරීම නොකළ යුත්තේය.

ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීම

22. 19 වැනි වගන්තිය යටතේ ලියාපදිංචිය සඳහා කරනු ලබන ඉල්ලීමක් 20 වැනි වගන්තිය යටතේ අවශ්‍යතා සම්පූර්ණ නොකරන්නේ නම් ලියාපදිංචි නොකළ යුතු අතර ඒ බව ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැනුම්දිය යුත්තේය.

23. (1) 19 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද ආයතනයක්, පුද්ගලයෙක්, ස්වේච්ඡා සංවිධානයක් මෙම ප්‍රඥප්තියේ අරමුණුවලට පටහැනිව කටයුතු කරන බවට හෝ නියෝග මගින් නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු නොකරන බවට අධ්‍යක්ෂවරයා තීරණය කරනු ලබන අවස්ථාවක ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවීම සිදුකළ හැකිය.

ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවීම

(2) ලියාපදිංචිය තාවකාලිකව අත්හිටවූ කළ එසේ කිරීමට හේතු වූ කරුණු අධ්‍යක්ෂවරයා විසින් ලියාපදිංචි සහතිකයේ හිමිකරු වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

(3) ලියාපදිංචිය තාවකාලිකව අත්හිටවූ අවස්ථාවක අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරන සාධාරණ කාලයක් තුලදී ඊට හේතු වූ කරුණු නිවැරදි කර අදාල අවශ්‍යතා සම්පූර්ණ කරන අවස්ථාවක ලියාපදිංචිය නැවත ලබාදිය යුතු ය.

24. ප්‍රඥප්තියේ 23 (3) වගන්තියට අනුව එම සාධාරණ කාලය තුළ අවශ්‍යතා සම්පූර්ණ නොකරන්නේ නම් ලියා පදිංචිය අවලංගු කර ඒ බව ලිඛිතව ඉල්ලුම්කරු වෙත දැන්විය යුතුය.

ලියාපදිංචිය අවලංගු කිරීම

25. මෙම ප්‍රඥප්තියේ 22 වගන්තිය යටතේ ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ බවට හෝ 24 වගන්තිය යටතේ ලියාපදිංචිය අවලංගු කල බවට දැන්වීමක් ලැබී දින 45ක් ඇතුළත අදාල පාර්ශවය විසින් ඊට එරෙහිව විෂයයභාර අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැක්කේය.

ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් වන අභියාචනා

26. (1) මෙම ප්‍රඥප්තියේ 25 වැනි වගන්තිය යටතේ අභියාචනයක් ලද අවස්ථාවක ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කොට තීරණයක් ලබාදීමට, අමාත්‍යවරයා විසින් ලේකම්වරයාට නියම කල යුතුය.

අභියාචනා බලතල

(2) ලේකම්වරයා විසින් ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව අධ්‍යක්ෂවරයාගේ තීරණය තහවුරු කිරීමට හෝ සංශෝධනය කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරිම සඳහා අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

(3) අභියාචනය ලැබී දින 45 ක් ඇතුලත ලේකම්වරයාගේ නිර්දේශය ලබාදිය යුතු අතර අවසානාත්මක තීරණය අමාත්‍යවරයාගේ තීරණය වන්නේය.

27. (1) මෙම ප්‍රඥප්තියේ 19 වන වගන්තිය යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව යම් ගොවිපලක්, ශීතාගාරයක්, නිෂ්පාදනාගාරයක් හෝ අලෙවිසලක් පවත්වා ගැනීමේ වරදට යම් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබ තිබියදීත් ඒ ගොවිපල, ශීතාගාරය, නිෂ්පාදනාගාරය අලෙවිසල් නොකඩවා පවත්වාගෙන යන අවස්ථාවක අධ්‍යක්ෂකවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද තැනැත්තෙකු විසින් වැසීමේ ආඥාවක් සඳහා කරන ලද ඉල්ලීමක් මත ඒ තැනැත්තා නැවත බලපත්‍රයක් ලබා ගන්නා තුරු ඒ ගොවිපල, ශීතාගාරය, නිෂ්පාදනාගාරය හෝ අලෙවිසල් වසා දැමීමේ ආඥාවක් නිකුත් කරනු ලැබිය හැකිය.

ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ හෝ අවලංගු කළ හෝ වසා දැමීමේ ආඥාව

(2) ඉහත වගන්තිය යටතේ වූ නඩු කටයුත්තක දී අධ්‍යක්ෂකවරයා හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධාරියකු විසින් නිකුත් කරන ලද සහතිකය, ඒ සහතිකයේ සඳහන් තැනැත්තා බලපත්‍රයක් නොමැතිව එකී ගොවිපල, ශීතාගාරය, නිෂ්පාදනාගාරය හෝ අලෙවිසල දිගටම පවත්වාගෙන යනබව දන්වමින් එහි ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(3) එසේ වුව ද මෙම ප්‍රඥප්තියේ 25 වැනි වගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක අභියාචනා පරීක්ෂණයේ තීන්දුව ලැබෙන තෙක් වසා දැමීම ප්‍රමාද කළ යුතු වන්නේය.

(4) මෙම ප්‍රඥප්තියේ 23(2) වැනි වගන්තිය යටතේ හා අභියාචනා පරීක්ෂණයෙන් අධ්‍යක්ෂවරයාගේ තීරණය තහවුරු වූ අවස්ථාවක එම තීන්දුව ලබාදුන් දින සිට දින 30ක් ඇතුළත වසා දැමීමට කටයුතු කළ යුතු ය.

28. පළාත් අධ්‍යක්ෂවරයා විසින් පළාතේ සත්ත්ව සුභ සාධනය පවත්වාගෙන යාමට තර්ජනයක් බවට හඳුනා ගන්නා අවස්ථාවක එයට අදාලව තාවකාලික වසා දැමීමේ ආඥාවක් මහෙස්ත්‍රාත් අධිකරණයකින් ලබා ගත යුතු ය.

විශේෂ අවස්ථාවක දී වසා දැමීමේ ආඥාව

වසා දැමීම

29. (1) 27(1) වගන්තිය යටතේ නිකුත් කරන ලද වසා දැමීමේ ආඥාවකට අනුකූලව ක්‍රියා කිරීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක ඒ වගන්තියෙහි වූ ගොවිපල, ශීතාගාරය, නිෂ්පාදනාගාරය හෝ අලෙවිසල වසා දැමීමට නියම කෙරෙන හා බලය දෙන ආඥාවක් මහේස්ත්‍රාත්වරයා විසින් අධිකරණයේ පිස්කල්වරයාට නියම කළ යුතු අතර ඒ ආඥාවෙහි සඳහන් ඒ ආඥාව නිකුත් කරන ලද දිනයේ සිට සම්පූර්ණ දින තුනකට කලින් වූ හෝ සම්පූර්ණ දින හතකට පසු දිනයක් නොවන දිනයකට පෙර, ඒ පිස්කල්වරයා විසින් ඒ අනුව ක්‍රියා කරනු ලැබිය යුතු ය. එකී ගොවිපල, ශීතාගාරය, නිෂ්පාදනාගාරය හෝ අලෙවිසල වසා දැමීම සඳහා එකී පිස්කල්වරයා හෝ එකී කාර්ය සඳහා ඔහු විසින් බලය දෙන ලද යම් පොලිස් නිලධාරියකු විසින් අවශ්‍ය යැයි සලකන යම් සහායකයන් ද සමඟ එම ගොවිපලට, ශීතාගාරයට, නිෂ්පාදනාගාරයට හෝ අලෙවිසලට ඇතුල් වීමට ඒ ආඥාව ඒ පිස්කල්වරයාට හෝ ඒ නිලධාරියාට ප්‍රමාණවත් අධිකාරයක් වන්නේය.

## IV කොටස

### *පශු සම්පත් සංවර්ධන පළාත් කමිටුව*

පශු සම්පත් සංවර්ධන පළාත් කමිටුව

30. පළාත් පශු සම්පත් ප්‍රඥප්තිය ක්‍රියාවට නැංවීම පහසු වනු පිණිස පශු සම්පත් සංවර්ධන පළාත් කමිටුවක් ස්ථාපිත කළ යුතු වන්නේය. පළාත් පශු සම්පත් විෂයභාර අමාත්‍යවරයා මෙම කමිටුවේ සභාපතිවරයා වන අතර පළාත් පශු සම්පත් විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා කමිටුවේ ලේකම්වරයා වන්නේය. මෙම කමිටුව පළාත් කෘෂිකර්ම කමිටුව හා පළාත් වාරිමාර්ග කමිටුව සමඟ ඒකාබද්ධව පැවැත්විය හැකි වන්නේය.

කමිටුවේ සංයුතිය

31. (1) මෙම කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වන්නේය ඃ

I. පළාත් පශු සම්පත් විෂයභාර අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව විසින් පශු වෛද්‍ය නිලධාරි කලාප නියෝජනය වන පරිදි නම් කරනු ලබන මන්ත්‍රීවරුන් පස් දෙනෙකු,
II. කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික් ලේකම්වරුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් දෙදෙනෙකු,
III. වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ,
IV. වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ,
V. වයඹ පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ,
VI. ගොවිජන සේවා කුරුණෑගල, පුත්තලම නියෝජ්‍ය සහ සහකාර කොමසාරිස්,
VII. වයඹ පළාත් ඉඩම් කොමසාරිස්,
VIII. වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
IX. වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්,
X. වයඹ පළාත් පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ,
XI. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නම් කරන ලද නියෝජිතයෙකු,
XII. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ දිස්ත්‍රික් කළමණාකරුවන්,
XIII. පළාත් සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ කලාප භාර නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්,
XIV. තීරණය කරනු ලබන රාජ්‍ය බැංකුවල නියෝජිතයන්,
XV. කලාප පශු සම්පත් සංවර්ධන කමිටුවල සභාපතිවරු,
XVI. පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ පළාත් නියෝජිතයෙකු,
XVII. සත්ත්ව නිෂ්පාදන සම්බන්ධ ප්‍රධාන ආයතනවල ප්‍රධානීන් තිදෙනෙකු,
XVIII. කිරි මිලදී ගන්නා අනුපිළිවෙල අනුව ප්‍රධාන කිරි මිලදී ගන්නා ආයතනවල නියෝජිතයන් තිදෙනෙකු,

(2) අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවන් සඳහා සංවිධාන ආයතනවල නියෝජිතයන් හෝ පුද්ගලයන් අවශ්‍යතාවය අනුව කමිටුවට කැඳවිය හැක්කේය.

පශුසම්පත් සංවර්ධන පළාත් කමිටුවේ සාමාජිකයින් පත් කිරීම

32. මෙම ප්‍රඥප්තියේ 31 (1) උපවගන්තියේ I සිට XIII දක්වා සාමාජිකයින් නිල බලයෙන් පත් වන අතර XIV සිට XVI දක්වා සාමාජිකයින් අමාත්‍යවරයා විසින් ඔහුගේ අභිමතය පරිදි පත් කළ හැක්කේය.

33. අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින්ගේ ධූර කාලය වසර දෙකක් වන්නේය. පත්කල සාමාජිකයින්ගේ ධූරකාලය

34. අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින්ගේ ධූර කාලය සම්පූර්ණවීම, ධූරයෙන් ඉල්ලා අස්වීම, අමාත්‍යවරයා විසින් ඔහුගේ අභිමතය පරිදි ධූරයෙන් ඉවත් කිරීම, අනුගාමී රැස්වීම් වාර තුනකට සහභාගි නොවීම හෝ සාමාජිකයෙකුගේ මරණය හෝ සිහිවිකලත්වය මත සාමාජිකත්වය අහෝසි වන අතර එම පුරප්පාඩු අමාත්‍යවරයා විසින් සම්පූර්ණ කළ යුතු වන්නේය. සාමාජිකත්වය අහෝසිවීම හා පුරප්පාඩු පිරවීම

35. පළාත් කමිටුව මාස දෙකකට එක් වරක් බැගින් රැස්විය යුතු වන්නේය. අවශ්‍ය වන්නේ නම් සභාපති වරයාගේ උපදෙස් මත ලේකම්වරයා විසින් අතිරේක රැස්වීම් කැඳවනු ලැබිය හැකිය. කමිටුවේ රැස්වීම්

36. (1) කමිටුවේ ගණ පූර්ණය සාමාජික සංඛ්‍යාවෙන් 1/4 විය යුතුය. ගණ පූර්ණය

(2) සාමාජිකයන්ගේ පුරප්පාඩු පැවතීම කමිටු රැස්වීම් පැවැත්වීමට හෝ රැස්වීම්වල තීරණ ගැනීම සඳහා බාධාවක් නොවන්නේය.

37. පශු සම්පත් සංවර්ධන පළාත් කමිටුවේ බලතල හා කාර්යය භාරය පහත පරිදි වේ. කමිටුවේ බලතල හා කාර්යභාරය

(1) ජාතික ප්‍රතිපත්තියට හා පළාත් අවශ්‍යතාවනට අනුකූලව සහ ප්‍රඥප්තියේ සඳහන් කාරණා සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා නිර්දේශ සහ යෝජනා ඉදිරිපත් කිරීම.

(2) ප්‍රඥප්තියේ සඳහන් කාරණා මෙහෙයවීමට හා ක්‍රියාවේ යෙදවීමට අදාල උපදෙස් ලබා දීම.

(3) පශු සම්පත් සංවර්ධන පස් අවුරුදු සැලැස්ම සහ කමිටුවට ඉදිරිපත් කරන මධ්‍යකාලීන, දිගුකාලීන හා අනිකුත් සංවර්ධන සැලසුම් අනුමත කිරීම.

(4) පළාත් පශු සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත්, මඟ පෙන්වීම් සහ සහාය ලබාදෙමින් ඒ පිළිබඳ පසු විපරම හා ඇගයීම.

(5) පළාත තුල කිසියම් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතනයක්, සංවිධානයක්, පදනමක්, සංසදයක්, ව්‍යාපෘතියක්, වැඩසටහනක් හෝ එවැනි සමගාමී ආයතනයක්, පුද්ගලයෙක්, පුද්ගල කණ්ඩායමක් විසින් පශු සම්පත් ව්‍යාප්තිය, ප්‍රවර්ධනය, අධ්‍යාපනය, සේවා සැපයීම සහ පර්යේෂණ උදෙසා කිසියම් ව්‍යාපෘතියක් හෝ වැඩසටහනක් ආරම්භ කිරීමට ප්‍රථමයෙන් අනුමැතිය ලබාදීම හා කොන්දේසි උල්ලංඝනය කරන අවස්ථාවල ඒ සම්බන්ධව කටයුතු කිරීම.

38. (1) පළාත් කමිටුව විසින් එහි රැස්වීම් වල කාර්යය කරගෙන යාම සඳහා අවශ්‍ය කාර්යය පටිපාටි සම්පාදනය කර ගත හැක්කේය. කාර්යය පටිපාටි හා සහභාගිත්ව දීමනා

(2) පළාත් කමිටුවේ රැස්වීම් වලට සහභාගි වන්නන් වෙනුවෙන් අමාත්‍ය වරයා විසින් තීරණය කරනු ලබන දීමනාවක් ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය යටතේ ගෙවනු ලැබිය හැක්කේය.

## V කොටස

### *ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති*

39. ග්‍රාම නිලධාරි කොට්ඨාශයක හෝ කොටසක හෝ කීපයක සත්ත්ව පාලන කටයුතු වල යෙදී සිටින ගොවින් ඒකරාශී වී සත්ත්ව පාලන ක්ෂේත්‍ර අනුව හෝ ඒකාබද්ධව ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති පිහිටුවා ගත හැකි අතර එම සෑම සමිතියක්ම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි විය යුතු වන්නේය. ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති පිහිටුවීම හා ලියාපදිංචිය

40. ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති ස්වකීය නාමයෙන් පශු සම්පත් කේෂ්ත්‍රයට අදාල සියලු කටයුතු ඉටු කිරීමටද නඩු පැවරීමට හා නඩු පැවරනු ලැබීමට ද වෙනත් නීති කෘත්‍යයන් සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමටද බලය ඇති සංස්ථාපිත ආයතනයක් වන්නේය. නීතිගත ආයතනයක් බව

41. ග්‍රාමීය මට්ටමේ පශු සම්පත් ක්ෂේත්‍රයේ නියැලෙන්නන් සංවිධානගත කර බලගැන්වීම තුළින් ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම මෙම සමිති පිහිටුවීමේ අරමුණ වන්නේය. සමිති පිහිටුවීමේ අරමුණ

සාමාජිකත්වය

42. සාමාජිකත්වය ලැබීම සඳහා සුදුසුකම් ඃ
(1) ශ්‍රී ලංකා පුරවැසියෙකුවීම;
(2) වයස අවුරුදු 18ට නොඅඩු වීම;
(3) පශු සම්පත් සංවර්ධන සමිති බල ප්‍රදේශයේ ගොවිපල පිහිටා තිබීම;
(4) ගොවිපල සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබීම.

සංයුතිය හා ධූර කාලය

43. සෑම ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිතියක් විසින්ම සමිතියේ නිලධාරීන් ලෙස සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, උප සභාපති, උප ලේකම් සහ සාමාජිකයින් 6 කින් සමන්විත කාරක සභාවක් පත්කර ගත යුතු අතර ඔවුන්ගේ ධූර කාලය පත් වූ දින සිට වසරක් වේ.

සමිති ව්‍යවස්ථාව

44. (1) ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති ව්‍යවස්ථාව අධ්‍යක්ෂවරයා විසින් සකස් කර අමාත්‍යවරයා විසින් අනුමත කළ යුත්තේය.

(2) එම ව්‍යවස්ථාව අනුව සෑම ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිතියක්ම කටයුතු කළයුතු වන්නේය.

45. ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිතිවල බලතල හා කාර්යභාරය පහත පරිදි වන්නේය.

1. පළාත් සැලැස්මට අනුකූලව ස්වකීය සමිති බල ප්‍රදේශය සඳහා පශු සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය හා නියාමනය.
2. සාමාජිකයන්ගේ ගොවිපල සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම හා අදාල ආයතන සමඟ සම්බන්ධීකරණය.
3. පශු සම්පත් ක්ෂේත්‍රයට අදාලව ස්වකීය බල ප්‍රදේශය තුළ පැන නගින ගැටළුවලට විසඳුම් ලබාදීම.
4. ක්ෂේත්‍රයට අදාල දත්ත පද්ධතියක් යාවත්කාලීනව පවත්වාගෙන යාම හා අවශ්‍ය අවස්ථාවලදී අදාල පාර්ශවයන් වෙත ලබාදීම.
5. සමිති සාමාජිකයින් සඳහා ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
6. සමිතියේ අරමුදල වර්ධනය කර ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
7. සාමාජිකයන්ගේ සුභ සාධනය සඳහා කටයුතු කිරීම.
8. ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන කමිටුව නියෝජනය සඳහා නියෝජිතයෙකු නම් කිරීම.
9. රක්ෂණ වැඩසටහන් සඳහා සහයවීම.
10. නව ගොවීන් බිහි කිරීමට අවශ්‍ය වැඩ සටහන් සංවිධානය කිරීම.

සමිති රැස්වීම් හා ගණ පූර්ණය

46. (1) සමිති රැස්වීම් මාසිකව හෝ ද්වි මාසිකව පැවැත්විය යුතු අතර සාමාජිකයන් බහුතරයකගේ ඉල්ලීම මත අතිරේක රැස්වීම් කැඳවිය හැක්කේය.

(2) ගණ පූර්ණය සාමාජිකයින්ගෙන් 1/3ට වඩා වැඩි විය යුතුය.

සාමාජිකත්වය හෝ ධූරය අහෝසිවීම

47. (1) පහත සඳහන් හේතූන් මත සාමාජිකත්වය අහෝසි වන්නේය.

I. ඉල්ලා අස්වීම.
II. අනුගාමී රැස්වීම් වාර තුනකට සහභාගි නොවීම.
III. මරණය හෝ සිහිවිකලත්වය.
IV. ව්‍යවස්ථාවට පටහැනි කටයුක්තක් සිදු කිරීම හෝ පශු සම්පත් කේෂ්ත්‍රයේ කටයුතු වලින් ඉවත්වීම හේතුවෙන් සාමාජිකයන්ගේ බහුතර කැමැත්ත මත ඉවත් කිරීම.

(2) සමාජිකත්වය අහෝසිවීම මත හෝ ඉල්ලා අස්වීම මත හෝ සමිති සාමාජිකයින්ගේ බහුතර කැමැත්ත මත හෝ ධූරය අහෝසි වන්නේය.

සමිතියේ අරමුදල්

48. ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන අරමුදල පහත ප්‍රභවයන්ගෙන් සමන්විත වේ.

I. සාමාජික මුදල්,
II. රාජ්‍ය, පළාත්, රාජ්‍ය නොවන සංවිධාන ප්‍රදාන
III. පුද්ගල පරිත්‍යාග
IV. අරමුදලේ පොළී හා ලාභ
V. වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන මුදල්

බලතල හා කාර්යයභාරය :

49. සමිති අරමුදලේ ගිණුම් — සමිති අරමුදලේ ගිණුම්.

(1) සමිති අරමුදලේ ගිණුම රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යා යුතු අතර ව්‍යවස්ථාවෙන් ප්‍රතිපාදිත ආකාරයට සමිති අරමුදලේ ගිණුම් පවත්වාගෙන යා යුත්තේ ය.

(2) අරමුදලේ ගිණුම පළාත් අධ්‍යක්ෂවරයා හෝ බලය පවරනු ලබන නිලධාරියෙකු විසින් වාර්ෂිකව හෝ අවස්ථානුකූලව පරීක්ෂා කල යුත්තේ ය.

50. (1) ස්වකීය බල ප්‍රදේශය තුළ පිහිටි ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිතිවල කටයුතු අධීක්ෂණය, ලේඛන පරීක්ෂාව, මඟ පෙන්වීම හා උපදෙස් ලබාදීම සත්ත්ව සංවර්ධන උපදේශකවරයා වෙත පැවරෙන්නේ ය. — සමිති අධීක්ෂණය.

(2) අධ්‍යක්ෂවරයා විසින් බලය පවරන නිලධාරියෙකුට ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති අධීක්ෂණය හා ලේඛන පරීක්ෂාව කල හැක්කේ ය.

51. (1) ලියාපදිංචි ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිතියක් පහත සඳහන් කාරණා එකක් හෝ කීපයක් හෝ මත ලියා පදිංචිය අවලංගු කිරීම සඳහා සහ ගණන් බේරා වසා දැමීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු ඈවරකරුවෙකු ලෙස පත් කල යුතු වන්නේ ය. — ලියාපදිංචිය අවලංගු කිරීම හා ඈවර කිරීම.

(I) සමිතියක සාමාජික සංඛ්‍යාව එකොළහකට වඩා අඩු වීම.

(II) එක් අවුරුද්දක් ඉක්මවන කාලපරිච්ඡේදයක් සමිතිය ක්‍රියාත්මක නොවීම.

(III) සමිති ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කිරීම.

(IV) සමිතියෙහි අරමුණු ඉටු කර ගැනීම සඳහා කටයුතු කිරීමට අපොහොසත් වී ඇති බව ප්‍රකාශ කරමින් එම සමිතියේ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට (2/3) නොඅඩු සංඛ්‍යාවක් විසින් ඈවර කිරීම සඳහා අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලීමක් කිරීම.

(2) ඉහත 51.1 උප වගන්තිය යටතේ පත් කල ඈවරකරුට විෂයයභාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ පූර්ණ අනුමැතියට යටත්ව පහත සිඳහන් බලතල ඇත්තේ ය.

(I) සමිතියේ ණය හිමියන් අතර ප්‍රමුඛතාව සම්බන්ධයෙන් තීරණය කිරීම.

(II) සමිතියේ දේපළ විකිණීම.

(III) සමිතිය විසින් හෝ ඊට එරෙහි හිමිකම්පෑම් කිසිවක් සමතයකට පත්කිරීම.

(IV) සමිතියේ වත්කම් නියමිත ආකාරයෙන් බෙදාහැරීම.

(3) ඈවරකරු විසින් කරනු ලබන අවලංගු කිරීම පිළිබඳ නිවේදනය පිළිවෙලින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් සංසරණය වන ප්‍රවෘත්ති පත්‍රවල පළකරනු ලැබිය යුතුය.

(4) සමිතිය ඈවර කිරීමේදී එහි අරමුදල ඈවර කිරීමේ වියදම පියවීම සඳහා ප්‍රථමයෙන් යෙදවිය යුතු අතර, ඉක්බිතිව එහි බැරකම් වලින් නිදහස්වීම සඳහා යෙදවිය යුතුය. ඈවර කිරීම නිම කිරීමෙන් පසුව ඉතිරිවන අතිරික්තය ක්ෂීර ප්‍රවර්ධන අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

## VI කොටස

### *ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන කමිටු*

52. සෑම ප්‍රාදේශීය පශු වෛද්‍ය නිලධාරී කොට්ඨාසයක් සඳහාම ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන කමිටුවක් පිහිටුවා දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කල යුතු වන්නේ ය. — ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන කමිටු පිහිටුවීම.

53. (1) ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන කමිටු ව්‍යවස්ථාව අධ්‍යක්ෂවරයා විසින් සකස් කර අමාත්‍යවරයා විසින් අනුමත කල යුත්තේ ය. — කමිටු ව්‍යවස්ථාව.

(2) එම ව්‍යවස්ථාව අනුව සෑම ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන කමිටුවක්ම කටයුතු කළයුතු වන්නේ ය.

කමිටුවේ සංයුතිය.

54. (1) කමිටුවේ සංයුතිය පහත පරිදි වන්නේය.

I. පශු වෛද්‍ය නිලධාරී
II. සත්ත්ව සංවර්ධන උපදේශකවරුන්
III. ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති මගින් නම් කරන ලද නියෝජිතයින් අතරින් ඔවුන්ගේ බහුතර කැමැත්තෙන් පත් කරනු ලබන දහ දෙනෙකු
IV. කෘෂි ප්‍රවර්ධන නිලධාරියෙකු
V. මහජන සෞඛ්‍ය පරීක්ෂකයෙකු
VI. පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් නම් කරන ලද කෘෂිකර්ම උපදේශකවරයකු
VII. පොල් සංවර්ධන නිලධාරීවරයෙකු
VIII. ප්‍රාදේශීය ලේකම් විසින් ක්ෂේත්‍රයට අදාලව නම් කරන ලද නිලධාරියෙකු
IX. පළාත් පාලන ආයතනයක පරිසර නිලධාරියෙකු
X. වයඹ පළාත තුළ කිරි මිලදී ගන්නා සමාගම්වල ප්‍රාදේශීය නියෝජිතයින්.

(2) නම් කල නියෝජිතයෙකු පුරප්පාඩු වූ අවස්ථාවක එම ක්ෂේත්‍රය නියෝජනය වන පරිදි පශු වෛද්‍ය නිලධාරිගේ නිර්දේශය මත කලාප භාර නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් වෙනත් නියෝජිතයෙකු නම් කළ යුතුය.

ආශ්‍රිත සාමාජිකත්වය.

55. පශු සම්පත් ක්ෂේත්‍රය හා සම්බන්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනවල නියෝජිතයින් සඳහා කමිටුවේ අනුමැතිය මත ආශ්‍රිත සාමාජිකත්වය ලබා ගත හැකි අතර, ඔවුන්ට ඡන්ද බලය හෝ නිලතල දැරීමේ හිමිකමක් නොමැත.

කමිටුවේ සභාපති හා ලේකම්.

56. කමිටුවේ සභාපති, ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති නියෝජිතයින්ගෙන් පත් විය යුතු අතර, ලේකම් නිල බලයෙන් කොට්ඨාසයේ පශු වෛද්‍ය නිලධාරීවරයා වන්නේ ය.

සාමාජිකයින්ගේ ධූර කාලය.

57. නිල නොවන සාමාජිකයින්ගේ ධූර කාලය ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිතියේ ඔහුගේ ධූර කාලය අහෝසිවීම මත අහෝසි වන්නේ ය.

කමිටු රැස්වීම හා ගණ පූර්ණය.

58. කමිටුවේ රැස්වීම් මාස 03 කට වරක් පැවැත්විය යුතු අතර කමිටුවේ ගණ පූර්ණය සාමාජිකයින්ගෙන් 1/3 කට වඩා වැඩි විය යුතුය.

කමිටුවේ කාර්යය භාරය.

59. කමිටුවේ කාර්යයභාරය පහත පරිදි වේ.

(1) පළාත් හා ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සැලසුම් පදනම් කරගෙන ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම.

(2) ප්‍රාදේශීය විභවතාවයන් අනුව විශේෂ ව්‍යාපෘති යෝජනා සකස් කර අදාල ආයතන සම්බන්ධීකරණය කරමින් ප්‍රතිපාදන සලසා ගැනීම.

(3) ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය සහයෝගය හා දායකත්වය ලබාදීම.

(4) ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිතිවලින් යොමු කරනු ලබන කරුණු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම.

(5) විවිධ මූල්‍ය ප්‍රභවයන්ගෙන් පශු සම්පත් ක්ෂේත්‍රයට අදාලව ලැබෙන ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව යෙදවෙන බවට වගබලා ගැනීම.

(6) කලාප පශු සම්පත් සංවර්ධන කමිටුව සඳහා නියෝජිතයින් නම් කිරීම.

(7) ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති හා කලාප පශු සම්පත් සංවර්ධන කමිටු අතර සම්බන්ධීකරණය.

(8) ප්‍රාදේශීය කමිටු බල ප්‍රදේශය සඳහා පශු සම්පත් ක්ෂේත්‍රයට අදාලව ලැබෙන ප්‍රතිපාදන ප්‍රතිලාභීන් වෙත වෙන් කිරීම.

(9) සත්ත්ව පාලන ක්ෂේත්‍රයට අදාල යෙදවුම් ප්‍රතිලාභීන්ට පහසුවෙන් ලබා ගැනීමට හැකිවන පරිදි කටයුතු කිරීම.

## VII කොටස

### *කලාප පශු සම්පත් සංවර්ධන කමිටු*

60. ප්‍රඥප්තියේ 7 වගන්තිය යටතේ නිර්ණය කරනු ලබන සෑම කලාපයක් සඳහාම කලාප පශු සම්පත් සංවර්ධන කමිටුවක් පිහිටුවා දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කල යුත්තේය. කලාප පශු සම්පත් සංවර්ධන කමිටු

61. කලාප පශු සම්පත් සංවර්ධන කමිටු ව්‍යවස්ථාව අධ්‍යක්ෂවරයා විසින් සකස් කර අමාත්‍යවරයා විසින් අනුමත කළ යුත්තේය. එකී ව්‍යවස්ථාවට අනුව කලාප පශු සම්පත් සංවර්ධන කමිටු කටයුතු කළ යුතු වන්නේය. කමිටු ව්‍යවස්ථාව

62. මෙම කමිටුවේ සංයුතිය පහත පරිදි වේ. කමිටුවේ සංයුතිය

(1) කලාපභාර නියෝජ්‍ය අධ්‍යක්ෂ,
(2) ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන කමිටුවල සභාපතිවරු,
(3) පළාත් අධ්‍යක්ෂ විසින් පත්කරන පශු වෛද්‍ය නිලධාරීන් හතර දෙනෙකු,
(4) පළාත් අධ්‍යක්ෂ විසින් පත්කරන ජ්‍යෙෂ්ඨ සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් හතර දෙනෙකු,
(5) පශු විමර්ශන නිලධාරියෙකු,
(6) පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ නම් කරන සහකාර අධ්‍යක්ෂවරයෙකු,
(7) පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සහ කිරි මිලදී ගන්නා සමාගම්වල නියෝජිතයන්,
(8) කෘෂි රක්ෂණ මණ්ඩල නියෝජිතයෙකු,
(9) දිස්ත්‍රික් ලේකම්ගේ නියෝජිතයෙකු,
(10) පරිසර අධිකාරියේ නියෝජිතයෙකු,
(11) දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ නියෝජිතයෙකු.

63. පශු සම්පත් ක්ෂේත්‍රය හා සම්බන්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනවල නියෝජිතයින් සඳහා කමිටුවේ අනුමැතිය මත ආශ්‍රිත සාමාජිකත්වය ලබා ගත හැකි අතර ඔවුන්ට ඡන්ද බලය හෝ නිලතල දැරීමේ හිමිකමක් නොමැත. ආශ්‍රිත සාමාජිකත්වය

64. කමිටුවේ සභාපති ප්‍රාදේශීය පශු සම්පත් කමිටු සභාපතිවරුන් අතරින් පත්කර ගත යුතු අතර ලේකම්වරයා නිල බලයෙන් කලාපභාර නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා වන්නේය. සභාපති හා ලේකම්

65. නිල නොවන සාමාජිකයෙකුගේ ධූර කාලය ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන කමිටුවේ ඔහුගේ ධූර කාලය අහෝසිවීම මත අහෝසි වන්නේය. ධූර කාලය

66. රැස්වීම් මාස 04 කට වරක් පැවැත්විය යුතු අතර ගණ පූර්ණය සාමාජිකයින්ගෙන් 1/3 කට වඩා වැඩි විය යුත්තේය. විශේෂ අවස්ථාවන්හිදී සභාපතිවරයා දැනුවත් කර ලේකම්වරයා විසින් අතිරේක රැස්වීම් කැඳවිය හැක්කේය. කමිටු රැස්වීම් හා ගණ පූර්ණය

67. කමිටුවේ කාර්යභාරය පහත පරිදිවේ. කමිටුවේ කාර්යයභාරය.

(1) කලාප පශු සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට ක්‍රියාකාරී දායකත්වය ලබා දීම.
(2) පළාත් පශු සම්පත් සංවර්ධන කමිටුව සමඟ සම්බන්ධීකරණය
(3) ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන කමිටුවලින් ඉදිරිපත්වන කරුණු සම්බන්ධව කටයුතු කිරීම.
(4) පළාත් පශු සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.
(5) ප්‍රාදේශීය පශු සම්පත් සංවර්ධන කමිටු සම්බන්ධීකරණය
(6) ක්ෂීර ප්‍රවර්ධන අරමුදලේ කළමනාකරණ මණ්ඩලය සඳහා කිරි ක්ෂේත්‍රයේ නියෝජිතයන් තිදෙනෙකු නම් කිරීම.

## VIII වන කොටස

### *ක්ෂීර ප්‍රවර්ධන අරමුදල*

ක්ෂීර ප්‍රවර්ධන අරමුදල

68. මෙහි මින් මතු *ක්ෂීර ප්‍රවර්ධන* අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබේ.

අරමුදල නීති ගත සංස්ථාවක් බවට

69. අරමුදල අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති ස්වකීය නාමයෙන් නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමටද වෙනත් නීති කෘත්‍යයන් සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමටද බලය ඇති නීති ගත සංස්ථාවක් වන්නේය.

අරමුදලේ භාරකාරත්වය

70. වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා අරමුදලේ භාරකාරත්වය දරන්නේය.

අරමුදලේ කළමනාකරණ මණ්ඩලය

71. *ක්ෂීර ප්‍රවර්ධන* අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය සඳහා කළමනාකරණ මණ්ඩලයක් පිහිටු විය යුත්තේය.

කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය

72. (1) මින් මතු මණ්ඩලය යනුවෙන් සඳහන් කරනු ලබන ක්ෂීර ප්‍රවර්ධන අරමුදලේ කළමනාකරණ මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වන්නේය.

(I) විෂය භාර පළාත් අමාත්‍යාංශ ලේකම්
(II) මිල්කෝ ආයතනයේ ප්‍රාදේශීය කළමනාකරු හා පෞද්ගලික කිරි මිලදී ගන්නා ආයතන දෙකක නියෝජිතයින් දෙදෙනෙකු
(III) කිරි ගව පාලන විෂයය ක්ෂේත්‍රයේ විශේෂඥවරයකු
(IV) පශු සම්පත් සංවර්ධන කලාප කමිටු විසින් නම් කරන කිරි ක්ෂේත්‍රයේ කටයුතු කරන නියෝජිතයන් තිදෙනෙකු

(2) විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් හැර අනෙකුත් නියෝජිතයන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතුය.

කළමනාකරණ මණ්ඩලයේ සභාපති ලේකම්

73. (1) විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන් මණ්ඩලයේ සභාපතිවරයා වන්නේය,

(2) පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා මණ්ඩලයේ ලේකම්වරයා වන්නේය.

මණ්ඩලයේ සාමාජිකයින් පත් කිරීම, ධූර කාලය හා සාමාජිකත්වය අහෝසි වීම

74. (1) අමාත්‍යවරයා විසින් පත්කළ සාමාජිකයෙකුගේ ධූරකාලය පත් කළ දින සිට වසර 3 ක් වන අතර ග්‍රාමීය හෝ කලාප පශු සම්පත් සංවර්ධන කමිටුවල සාමාජිකත්වය අහෝසිවීම මත ධූර කාලයද අහෝසි වන්නේය.

(2) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙකු සිය ධූරයේ වගකීම් යථා පරිදී නොදරන බවට හෝ එම තනතුරු දැරීම හානිකර යැයි අමාත්‍යවරයාට තහවුරු වන ඕනෑම අවස්ථාවක එම ධූරයෙන් ඉවත් කිරීමට අමාත්‍ය වරයාට බලය ඇත්තේය.

(3) නිල තත්ත්වය මත පත් කරන ලද සාමාජිකයෙකු එම නිලය දැරීම අවසන් වනවාත් සමග ඔහුගේ සාමාජිකත්වය අහෝසි වන්නේය.

(4) අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලිඛිත ඉල්ලීමක් මගින් නිල තත්ත්වය මත පත් කරන ලද සාමාජිකයෙකුට හැර වෙනත් සාමාජිකයෙකුට සිය සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීමට අවකාශ ඇත්තේය.

(5) සාමාජිකයෙකුගේ මරණය හෝ සිහිවිකලත්වය මත සාමාජිකත්වය අහෝසි වන්නේය.

(6) සාමාජිකයෙකු ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් ඇතිවන පුරප්පාඩුවක් සඳහා නැවත පත් කරනු ලබන තැනැත්තෙකුගේ ධූර කාලය පූර්ව සාමාජිකයා පත් කරන ලද ධූර කාලයෙන් ඉතිරි කාලයට සීමා විය යුත්තේය.

දීමනාවක් ගෙවිය හැකි බව

75. මෙම මණ්ඩලයේ සාමාජිකයන්ට හා ලේකම්ට විෂයභාර අමාත්‍යවරයා නිශ්චය කරනු ලබන සහභාගිත්ව දීමනාවක් ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට යටත්ව ගෙවිය හැක්කේය.

76. මණ්ඩලයේ ගණ පූර්ණය සභාපති ඇතුලුව අවම වශයෙන් 05 ක් විය යුත්තේය.

77. (1) අරමුදල නමින් ජංගම බැංකු ගිණුමක් රාජ්‍ය බැංකුවක පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් පවත්වාගෙන යා යුතුය. මණ්ඩලයේ ගණ පූර්ණය අරමුදලේ බැංකු ගිණුම්

(2) අරමුදලට ලැබෙන සියලුම මුදල් එම ගිණුමට බැර කල යුතුය.

(3) අතිරික්ත අරමුදල් රැස්වන අවස්ථාවන්හිදී රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පතුවක එම මුදල් තැන්පත් කිරීමට කටයුතු කළ හැකිය.

78. අරමුදලේ සංයුතිය පහත පරිදි වේ:- අරමුදලේ සංයුතිය

(1) පශු සම්පත් සංවර්ධන කටයුතු සඳහා වාර්ෂිකව පිළියෙල කරනු ලබන පශු සම්පත් සංවර්ධන සැලැස්මට අනුව පළාත් සභා අරමුදලින් සපයනු ලබන අරමුදල්

(2) රජයේ හෝ පළාත් සභා ආයතන විසින් ලබා දෙනු ලබන අරමුදල්

(3) දෛනික මිලදී ගැනීම කිරි ලීටර් 1000 ඉක්මවන, පළාත තුල කිරි මිලදී ගන්නා ආයතනවලින් ලීටර් එකකට රුපියල බැගින් ලැබෙන දායකත්ව මුදල්

(4) පළාත තුළ සත්ත්ව සංවර්ධනය සඳහා දායක වන දේශීය, විදේශීය රාජ්‍ය නොවන, පෞද්ගලික සංවිධාන මගින් කරනු ලබන පරිත්‍යාග හා ප්‍රදාන

(5) ස්ථාවර තැන්පත් පොළිය

(6) රක්ෂණ වාරික

(7) ග්‍රාමීය පශු සම්පත් සංවර්ධන සමිති ඈවර කිරීමෙන් පසු ඉතිරිවන අතිරික්තය

(8) මෙම ප්‍රඥප්තියේ නියමයන්ට පටහැනිව සිදුකරන වරදවල් සඳහා අධිකරණය මගින් යොමු කරන ලබන දණ්ඩන මුදල්

(9) ණය වාරික හා පොළී මුදල්

(10) ආයතන හා ගොවිපල් ලියාපදිංචි ගාස්තු

(11) වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන මුදල්

79. කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව වයඹ පළාත් මූල්‍ය රෙගුලාසි හා මුදල් රෙගුලාසි වල විධිවිධානයන්ට අනුව පහත කරුණු සම්බන්ධයෙන් අරමුදලේ මුදල් යෙදවීමට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට හැක්කේය. අරමුදලේ වියදම්

(1) ක්ෂීර ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ගෙවීම්

(2) ප්‍රතිලාභීන් සඳහා ණය ලබාදීම්

(3) රක්ෂණ වන්දි මුදල් ගෙවීම්

(4) ආයතනික හා පරිපාලන වියදම්

80. අරමුදලේ කාර්යයභාරය පහත පරිදි වේ:- අරමුදලේ කාර්යභාරය

(1) කිරි නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

(2) සහන ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

(3) රක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

(4) ගොවීන් බල ගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

(5) පළාත් බද පර්යේෂණ කටයුතු

(6) මානව සම්පත් සංවර්ධනය

81. රජයේ විගණකාධිපති වරයා විසින් අරමුදලේ ගිණුම විගණනය කළ යුත්තේය. ගිණුම් විගණනය

**82.** අරමුදලේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය වන නියෝග පැනවීමට විෂයභාර අමාත්‍යවරයාට හැකි වන්නේය. නියෝග පැනවීම

83. (1) අරමුදලේ කාර්යයන් විෂය භාර අමාත්‍යාංශ සහ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලය මගින් ඉටු කර ගත යුත්තේය. අරමුදලේ කාර්යය මණ්ඩලය හා පාරිශ්‍රමික

(2) කාර්යය මණ්ඩල කටයුතු සඳහා අතිරේක පාරිශ්‍රමිකයක් ගෙවිය යුතු අවස්ථාවන්හිදී අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන දීමනාවක් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය යටතේ ගෙවිය හැකි වන්නේය.

## IX වන කොටස

### *පොදු විධිවිධාන*

අමාත්‍යවරයා සතු බලතල

84. (1) ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්, මග පෙන්වීම් හා නියෝග නිකුත් කිරීම අමාත්‍යවරයා විසින් කලයුතු වන්නේය.

(2) ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ සඳහන් කොට්ඨාශ නිර්ණය කිරීම අමාත්‍යවරයා විසින් කල යුතු අතර *ගැසට් පත්‍රයේ* පළකල යුත්තේය.

(3) පළාත තුල හා පළාතෙන් පිටතට සතුන් ප්‍රවාහනයේදී අවස්ථානුකූලව සීමා පැනවීමේ බලය අමාත්‍යවරයා සතු වන්නේය.

(4) පළාත තුල සත්ත්ව රෝග වැලැක්වීම, පාලනය කිරීම සඳහා නියෝග පැනවීමේ බලය අමාත්‍යවරයා සතු වන්නේ ය.

නියෝග

85. (1) ප්‍රඥප්තියේ 84.(1) වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් පනවනු ලබන සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පල කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයේ සිට හෝ නියෝගයේ සඳහන් දිනක සිට හෝ එම නියෝගය ක්‍රියාත්මක විය යුතු වන්නේය.

(2) අමාත්‍යවරයා විසින් පනවනු ලබන සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතුය. පළාත් සභාව විසින් අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක්ම ඒ යටතේ කලින් කරනු ලැබූ යම් කරුණකට අගතියකින් තොරව පරිච්ඡින්න විය යුතු අතර, ඒ පිළිබඳව නිවේදනයක් *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතුය.

අභියාචනා බලතල

86. (1) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන හෝ ඒ යටතේ පනවනු ලැබූ නියෝග යටතේ හෝ කිසියම් නිලධාරියකු විසින් කරනු ලැබූ නියමයක් හෝ තීරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත අභියාචනා කළ හැක්කේය.

(2) අමාත්‍යවරයාගේ නියෝග මත ලේකම්වරයා විසින් පත්කරනු ලබන නිළධාරියකු හෝ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ඒ පිළිබඳව කරනු ලබන පරීක්ෂණයක නිර්දේශ මත එම නියමය හෝ තීරණය තහවුරු කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ සංශෝධනය කිරීම අමාත්‍යවරයාට කල හැකි වන්නේය.

තොරතුරු ලබා ගැනීමේ අයිතිය

87. පශු සම්පත් ක්ෂේත්‍රයේ තොරතුරු ඉල්ලනු ලබන ඕනෑම අවස්ථාවකදී මෙම ප්‍රඥප්තියේ 19 වගන්තිය යටතේ ලියා පදිංචි සියලුම පාර්ශව විසින් නිවැරදිව පළාත් අධ්‍යක්ෂ වෙත ලබාදිය යුතු වන්නේය.

මාසික වාර්තාව

88. මෙම ප්‍රඥප්තියේ 19 වගන්තිය යටතේ ලියා පදිංචි පළාතේ නිෂ්පාදිත කිරි, මස්, බිත්තර මිලදී ගන්නා සියලුම ආයතන විසින් මාසයක් තුල තමන් මිලදී ගත් ප්‍රමාණය පිළිබඳව මාසික වාර්තාවක් පළාත් අධ්‍යක්ෂවරයා විසින් නියම කරන ආකෘතියකට අනුකූලව එළඹෙන මාසයේ 15 වන දිනට පෙර අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුත්තේය.

දායකත්ව මුදල

89. මෙම ප්‍රඥප්තියේ 19 වගන්තිය යටතේ ලියාපදිංචි පළාත තුල දෛනිකව කිරි ලීටර් 1000ට වඩා වැඩියෙන් කිරි මිලදී ගන්නා ආයතන වලින් ලීටර් එකකට රුපියල බැගින් දායකත්ව මුදලක් ක්ෂීර ප්‍රවර්ධන අරමුදලට ගෙවිය යුත්තේය.

ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා අනුමැතිය ලබා ගැනීම.

90. පළාත තුල කිසියම් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතනයක්, සංවිධානයක්, පදනමක්, සංසදයක්, ව්‍යාපෘතියක්, වැඩසටහනක් හෝ එවැනි සමගාමී ආයතනයක්, පුද්ගලයෙක්, පුද්ගල කණ්ඩායමක් විසින් පශු සම්පත් ව්‍යාප්තිය, ප්‍රවර්ධනය, අධ්‍යාපනය, සේවා සැපයීම සහ පර්යේෂණ උදෙසා කිසියම් ව්‍යාපෘතියක් හෝ වැඩසටහනක් ආරම්භ කිරීමට ප්‍රථමයෙන් පශු සම්පත් සංවර්ධන පළාත් කමිටුවේ අනුමැතිය ලබා ගත යුත්තේය.

## X වන කොටස

### *වැරදි හා දඬුවම්*

විධිවිධාන හෝ නියෝග උල්ලංඝණය කිරීම

91. මෙම ප්‍රඥප්තිය යටතේ පනවා ඇති විධිවිධාන හෝ නියෝග උල්ලංඝණය කරනු ලබන ඕනෑම පුද්ගලයෙකු හෝ ආයතනයක් වරදකට වරදකරු වන්නේය.

92. මෙම ප්‍රඥප්තියේ 16,19,21,87,88,89,90 යන වගන්තිවල සඳහන් යම් විධිවිධානයක් කඩ කරන හෝ එකගව කටයුතු කිරීම පැහැර හරින ඕනැම තැනැත්තකු වරදක් කරනු ලබන අතර මහේස්ත්‍රාත්වරයෙකු විසින් කරනු ලබන ලඝු නඩු විභාගයකදී වරදකරු කරනු ලැබූ විට රු.100,000/කට නොවැඩි දඩයකට හෝ මාස 12 නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දණ්ඩනයකට හෝ එකී දණ්ඩනයන් දෙකටම හෝ යටත් කලයුතු වන්නේය. වැරදි

93. මෙම ප්‍රඥප්තිය යටතේ යම් වරදක් සිදු කරනු ලැබූ විට නඩු පැවරීමේ බලය පළාත් අධ්‍යක්ෂ හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු සතු වන්නේය. නඩු පැවරීමේ බලය

## XI වන කොටස

### අර්ථ නිරූපන

94. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස අර්ථ නිරූපන

පළාත, යන්නෙන් වයඹ පළාතද,

පළාත් සභාව, යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවද,

ආණ්ඩුකාරවරයා, යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා ද,

අමාත්‍යවරයා, යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ පශු සම්පත් විෂයභාර අමාත්‍යවරයා ද,

පළාත් අමාත්‍යාංශය, යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ පශු සම්පත් විෂයභාර අමාත්‍යාංශය ද,

ලේකම්වරයා, යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ පශු සම්පත් විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා ද,

දෙපාර්තමේන්තුව, යන්නෙන් වයඹ පළාතේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ද,

අධ්‍යක්ෂවරයා, යන්නෙන් වයඹ පළාතේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා ද,

පළාත්බද පශු පර්යේෂණ, යන්නෙන් පළාත් මට්ටමින් පශු සම්පත් සංවර්ධන ක්‍රියාවලියේදී ඇතිවන්නා වූ තාක්ෂණික ගැටලු හා ඒ සම්බන්ධ ගැටලු තත්ත්වයන් නිරාකරනය කිරීම සහ නව සොයා ගැනීම් සඳහා නිර්දේශ ලබා ගැනීම සහ හඳුන්වාදෙනු ලබන තාක්ෂණ හා නිර්දේශවල අදාලත්වය තහවුරු කිරීම සඳහා පළාත් මට්ටමින් කරනු ලබන (මූලික සිද්ධාන්ත ගොඩනැගීම සඳහා නොවන) අත්හදා බැලීම් ද,

ගොවිපල, යන්නෙන්, එළගවයින්, මීගවයින්, එළුවන්, බැටළුවන්, ඌරන්, සාවුන්, කුකුළන්, වටුවන්, තාරාවන් හා කළුකුන් යන සතුන් ඇති කරන හා නඩත්තු කරන ඒකක ද

නිෂ්පාදනාගාරයක්, යන්නෙන් පශු සම්පත් ක්ෂේත්‍රය ආශ්‍රිත ආහාර ද්‍රව්‍ය, භාණ්ඩ, උපකරණ, ඖෂධ, සත්ත්ව ආහාර සකස් කරන හෝ අගය එකතු කරන ස්ථානයක් ද

පශු සම්පත්, යන්නෙන් එළගවයින්, මීගවයින්, එළුවන්, බැටළුවන්, ඌරන්, සාවුන්, කුකුළන්, වටුවන්, තාරාවන් හා කළුකුන් යන සතුන් ද

රාජ්‍ය බැංකු, යන්නෙන් ලංකා බැංකුව, මහජන බැංකුව හා ඉතිරි කිරීමේ බැංකුව ද

සාධාරණ කාලය, යන්නෙන් යම් කරුණකට අදාලව එහි ස්වාභාවය අනුව අවස්ථානුකුලව පළාත් අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ලබන කාලයක් ද අදහස් වේ.

95. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා සහ පාඨ අතර යම් අනනුකුලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය. අනනුකුලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

09 - 977

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.